# ගිණුම්කරණ සමීකරණ

ගයාන් දිලීප

ලූකා පැසියෝලිගේ දෙවන පරපුර ...

**Weekly paper 03**

1. සුනිල්ගේ ව්‍යාපාරයට අදාලව පහත තොරතුරු සපයා ඇත.

2018.08.01 දිනට පැවති ශේෂයන,

| | | | |
|---|---|---|---|
| ඉඩම් | 6 000 000 | වෙළෙඳ ගෙවිය යුතු | 1 500 000 |
| ගොඩනැගිලි | 1 200 000 | බැංකු ණය | 1 000 000 |
| යන්ත්‍ර | 2 800 000 | රඳවාගත් ලාභය | 2 000 000 |
| වෙළෙල ලැබිය යුතු | 1 000 000 | මුදල් | 2 500 000 |
| තොගය | 500 000 | ප්‍රාග්ධනය | ? |

2018 අගොස්තු මාසය තුළ පහත ගනුදෙනු සිදුවිය.

| | | |
|---|---|---|
| I. | අගෝ 02 | පිරිවැය රු. 300 000 ක තොගයක් පිරිවැයට 20% ක ලාභාන්තිකයක් සහිතව අමරට විකිණීම. |
| II. | අගෝ 06 | ලකුණුකල මිල රු. 400 000 ක තොගයක් නැවත විකිණීමේ පරමාර්ථයේ 10% වෙළෙඳ වට්ටමක් අඩුකර ණයට මිලදී ගැනීම. |
| III. | අගෝ 07 | වෙළෙඳ ලැබිය යුතු ශේෂයෙන් අඩක් පියවීම සඳහා 10% වට්ටම් අඩුකරගෙන මුදල් ලැබුණි. |
| IV. | අගෝ 10 | ව්‍යාපාරය විසින් ගෙවූ අළුත්වැඩියා වියදම රු. 60 000 කි. |
| V. | අගෝ 17 | ණයහිමියන්ට ගෙවූ මුදල රු. 90 000 ක් වූ අතර ලද වට්ටම රු. 10 000 කි. |
| VI. | අගෝ 19 | වෙළෙඳ ලැබිය යුතු ශේෂයෙන් රු. 70 000 ක් බොල්ණය ලෙස ලියාහරින ලදි. |
| VII. | අගෝ 20 | ලද කුළී ආදායම රු. 100 000 කි. |
| VIII. | අගෝ 24 | ව්‍යාපාරයේ අගොස්තු මාසයේ විදුලි බිල රු. 40 000 සැප්තැම්බර් 06 ලැබුණු අතර අගොස්තු 24 රු. 30 000 ක් පමණක් ගෙවා ඇත. |
| IX. | අගෝ 26 | සියළුම ස්ථාවර වත්කම් (දේ.පි.අ) (ඉඩම් හැර) පිරිවැය මත 12% වාර්ෂිකව ක්ෂය වෙන්කළ යුතුය. |
| X. | අගෝ 30 | අයිතිකරුගේ මුදල් ගැණිලි රු. 60 000 ක් වන අතර භාණ්ඩ ගැණිලි රු. 40 000 කි. |

අගොස්තු මාසය සඳහා ඉහත ගනුදෙනුවල බලපෑම පහත ගිණුම්කරණ සමීකරණ මගින් දැක්වීම,

I.

| අංකය | වත්කම් | | | | = | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේ.පි.උපකරණ | වෙළෙඳ ලැබිය යුතු | තොගය | මුදල් | | වෙළෙඳ ගෙවිය යුතු සහ උපචිත වියදම් | බැංකු ණය | රඳවාගත් ලාභ | ප්‍රාග්ධනය |

II.

| අංකය | වත්කම් | | = | වගකීම් | | හිමිකම් | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ජංගම නොවන | ජංගම | | ජංගම නොවන | ජංගම | ආදායම් | වියදම් | ප්‍රාග්ධනය |

III. ශුද්ධ වත්කම් මගින් ලාභය ගණනය කරන්න.

2. මලින්දි විසින් මුදලින් රු. 800 000 ක් සහ රු. 3 400 000 ක් වටිනා ගොඩනැගිල්ල යොදවා ආරම්භකල ව්‍යාපාර ආයතනයට අදාලව පහත තොරතුරු උපුටා ගන්නා ලදි.

I. පිරිවැය රු. 1 600 000 ක් වටිනා තොගයක් එදිනම රු. 600 000 ක් ගෙවා මිලදී ගත් අතර ඉතිරි ශේෂය මාසයක් ඇතුලත ගෙවීමට එකග විය.

II. පිරිවැය රු. 250 000 ක තොගයක් පිරිවැයට 40% ලාභයක් සහිතව ණයට අලෙවි කරන ලදි.

III. ව්‍යාපාරය විසින් රු. 50 000 ක ප්‍රචාරන වියදමක් ගෙවන ලදි.

IV. ගනුදෙනු අංක II දැක්වෙන අලෙවි කළ තොගයෙන් හරි අඩක් ආපසු එවන ලදි.

V. මසය සදහා අදාලවන සේවක වේතනය රු. 84 000 ක් වන අතර රු. 100 000 ක් මාසය තුළ මුදලින් ගෙවා ඇත.

VI. ආයතනයක් විසින් රු. 8 000 000 ක බැංකු ණයක් මගින් රථවාහනයක් මිලදී ගන්නා ලදි.

VII. පිරිවැය රු. 60 000 ක තොගයක් රු. 80 000 කට අමරට අලෙවි කල අතර එදිනම රු. 30 000 ක මුදල ලැබුණි.

VIII. මාසය සදහා දේපළ පිරියත උපකකරණවල ක්ෂයවීම රු. 20 000 කි.

IX. අයිතිකරු විසින් ව්‍යාපාරයේ රු. 500 000 ක බැංකු ණය සහ රු. 50 000 ක පොළිය තම පෞද්ගලික මුදලින ගෙවන ලදි.

X. ගෙවූ හිමිකරුගේ ජීවිත රක්ෂණ වාරිකය රු. 60 000 කි.

අවශ්‍යවන්ගේ,

I. පහත ගිණුම්කරණ සමීකරණය යටතේ ඉහත ගනුදෙනුවල බලපෑම දැක්වීම.

| අංකය | වත්කම් | | | | = | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේ.පි.උප කරණ | වෙළෙඳ ලැබිය යුතු | තොගය | මුදල් | | වෙළෙඳ ගෙවිය යුතු සහ උපචිත වියදම් | බැංකු ණය | රදවාගත් ලාභ | ප්‍රාග්ධනය |

II. පහත ගිණුම්කරණ සමීකරණය යටතේ ඉහත ගනුදෙනුවල බලපෑම දැක්වීම.

| අංකය | වත්කම් | | = | වගකීම් | | හිමිකම් | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ජංගම නොවන | ජංගම | | ජංගම නොවන | ජංගම | ආදායම් | වියදම් | ප්‍රාග්ධනය |

III. 2018.03.31 දිනෙන් අවසන් මාසය සදහා ඉහත ගනුදෙනු අදාලවේ යැයි උපකල්පනය කරමින් 2018.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.

IV. 2018.03.31 දිනෙන් අවසන් මාසය සදහා ශුද්ධ ලාභය.

V. 2018.03.31 දිනට හිමිකමේ සංයුතිය දක්වන්න.

3. ආයතනයක් විසින් පිරිවැය රු. 400 000 ක තොගයක් පිරිවැයට 20% ක ලාභාන්තිකයක් සහිතව ණයට අලෙවි කරන ලදි. පසුව මෙම තොගයෙන් පිරිවැය රු. 160 000 ක තොගයක් ආපසු එවන ලදි.

I. ආපසු එවන ලද තොගයේ විකුණුම් මිල ගණනය කරන්න.

..............................................................................................................

II. ඉහත ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ ලාභයට ඇතිවූ ශුද්ධ බලපෑම ගණනය කරන්න.

..............................................................................................................

4. සුජානි විසින් පිරිවැය රු. 500 000 ක තොගයක් පිරිවැයට 20% ලාභාන්තිකයක් සහිතව ණයට අලෙවි කරන ලදි. මෙම භාණ්ඩ තොගයෙන් විකුණුම් මිල රු. 180 000 ක තොගයක් ආපසු එවන ලදි.

I. ආපසු එවන ලද තොගයේ පිරිවැය ගණනය කරන්න.

..............................................................................................................

II. ආපසු එවන ලද තොගයේ ලාභය ගණනය කරන්න.

..............................................................................................................

III. ඉහත ගනුදෙනුව නිසා ව්‍යාපාරයේ ලාභයට ඇතිවූ ශුද්ධ බලපෑම ගණනය කරන්න.

..............................................................................................................

5. 2017.04.01 දිනට නාරදගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ව ප්‍රකාශය පහත පරිදි දක්වා ඇත.

2017.04.01 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය,

| | | | | | |
|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | **හිමිකම්** | | |
| ඉඩම් | 6 000 000 | | ප්‍රාග්ධනය | 7 500 000 | |
| රථවාහන | 4 000 000 | **10 000 000** | රඳවාගත් ලාභය | 500 000 | **8 000 000** |
| **ජංගම වත්කම්** | | | **ජංගම නොවන වගකීම්** | | |
| තොගය | 500 000 | | බැංකු ණය | 1 000 000 | |
| වෙළෙඳ ලැබිය යුතු | 1 400 000 | | **ජංගම වගකීම්** | | |
| මුදල් හා බැංකු ශේෂව | 600 000 | **2 500 000** | වෙළෙඳ ගෙවිය යුතු | 1 200 000 | |
| | | | ගෙවිය යුතු වියදම් | 2 300 000 | **4 500 000** |
| **මුළු වත්කම්** | | 12 500 000 | **මුළු හිමිකම් හා වගකීම්** | | 12 500 000 |

පහත ගනුදෙනු 2017/2018 ගිණුම් වර්ෂයට අදාලව සිදුවිය.

I. පිරිවැය රු. 200 000 ක තොගයක් රු. 20 000 ක අලාභයක් සහිතව ණයට විකිණීම.

II. වෙළෙඳ ලැබිය යුතු ශේෂයෙන් රු. 400 000 ක ශේෂයක් සඳහා 10% ක වට්ටමක් අඩුකරගෙන මුදල් ලැබුණි.

III. අයිතිකරු විසින් රු. 4 500 000 ක මුදලක් ව්‍යාපාරය වෙනුවෙන් යොදවන ලදි.

IV. ආරම්භක ගෙවිය යුතු වියදම් සම්පූර්ණ අගය මුදලින් ගෙවන ලදි.

V. රු. 3 500 000 ක සේවා ආදායමක් මුදලින් ලැබුණි.

VI. මෙම වර්ෂය සඳහා වන දුරකථන වියදම රු. 700 000 ක් වන අතර මෙතෙක් මුදල් ගෙවා නොමැත.

VII. මුදලින් ලද සේවා ආදායම රු. 750 000 කි.

VIII. සියළු දේපළ පිරියත හා උපකරණවල වාර්ෂික ක්ෂයවීම රු. 200 000 කි.

IX. ලකුණුකළ මිල රු. 800 000 ක තොගයක 25% ක වෙළෙඳ වට්ටමකට යටත්ව ණයට මිලදී ගැනීම.

X. පිරිවැය රු. 500 000 ක තොගයක් පිරිවැයට 40% ක ලාභාන්තිකයක් එකතු කර මිල ලකුණු කරයි. ආයතනය විසින් ලකුණු කල මිල මත 20% වෙළෙඳ වට්ටමක් අඩුකර තොගය අත්පිට විකුණා ඇත.

XI. ගෙවූ බැංකු ණය වාරිකය රු. 600 000 ක් වූ අතර වාරිකය තුළ ඇතුලත් ණය පොළිය රු. 100 000 කි.

**අවශ්‍යවන්නේ,**

I. පහත ගිණුම්කරණ සමීකරණය යටතේ ඉහත ගනුදෙනුවල බලපෑම දැක්වීම.

| අංකය | වත්කම් | | | | = | වගකීම් | | හිමිකම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේ.පි.උප කරණ | වෙළෙඳ ලැබිය යුතු | තොගය | මුදල් | | වෙළෙඳ ගෙවිය යුතු සහ උපචිත වියදම් | බැංකු ණය | රඳවාගත් ලාභ | ප්‍රාග්ධනය |

II. පහත ගිණුම්කරණ සමීකරණය යටතේ ඉහත ගනුදෙනුවල බලපෑම දැක්වීම.

| අංකය | වත්කම් | | = | වගකීම් | | හිමිකම් | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ජංගම නොවන | ජංගම | | ජංගම නොවන | ජංගම | ආදායම් | වියදම් | ප්‍රාග්ධනය |

III. 2018.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ඉහත ගනුදෙනු අදාලවේ යැයි උපකල්පනය කරමින් 2018.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය.

IV. 2018.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය.

V. 2018.03.31 දිනට හිමිකමේ සංයුතිය දක්වන්න.

**071 26 16 609**